# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2019.07.11

වේලාව : පෙ.ව. 9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත.

## සහභාගි වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :

| | | | |
|---|---|---|---|
| **1)** | ප්‍රදීප් යසරත්න මහතා | - | ප්‍රධාන ලේකම් (බ.ප) |
| **2)** | හේමන්ත සමරකෝන් මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| **3)** | චන්ද්‍රානි සමරකෝන් මිය | - | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප) |
| **4)** | එස්.ජී.විජයබන්ධු මහතා | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප) |
| **5)** | එන්.නිල්වල මහතා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප) |
| **6)** | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්, ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය (බ.ප) |
| **7)** | එච්.ජී.ජී.ජේ.ධර්මසේන මහතා | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| **8)** | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| **9)** | සිරිසෝමලොකුවිතානමහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| **10)** | එන්.බන්දුල ප්‍රේමකුමාර මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| **11)** | ඩී.එම්.එන්.දිසානායක මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| **12)** | ඩබ්ලිව්.එම්.ඩී.එන්.රණසිංහ මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| **13)** | පාලිතඅබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරි |
| **14)** | පේෂලාආර්. අබේසූරියමිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| **15)** | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| **16)** | ඒ.තලංගම මහතා | - | මූලස්ථාන ඉංජිනේරු |

**ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ටඑළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිරපළාත් සහා නව ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම සම්බන්ධව | පළාත් සභා නවගොඩනැගිල්ලේ ස්ථාපිත අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවලටභාණ්ඩ මිලදී ගැනීම් කටයුතු මේ වන විට අවසන් වී ඇති බව අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පැහැදිලි කරන ලදී.<br><br>සභා ලේකම් කාර්යාලයේ මන්ත්‍රීවරුන් සඳහාGalleryපුටුලබා ගැනීමටඉදිරි කටයුතු සිදු කිරීමට ද තීරණය විය.<br><br>එසේම, නව ශ්‍රවණාගාරය සඳහා පිත්තලරාජ්‍ය ලාංඡනය සහිත දැවමය Podium එකක් මිලදී ගැනීම සඳහා දතීරණය විය.<br><br>රක්ෂණ බලපත්‍රය අලුත් කිරීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවලින් මිලදී ගත් නව භාණ්ඩවල වටිනාකම් ද ඇතුළත් කර, එම තොරතුරු සති 2ක් ඇතුළත පාලන අංශය වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සභාලේකම්, බ.ප පළාත් සභාව<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 02. | පළාත් සභා ගොඩනැගිල්ලේ මාර්ග සටහන් පුවරු සවි කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිල්ලේ බිම් මහලේ ප්‍රධානප්‍රවේශ දොරටු දෙකෙහිආයතන හඳුනා ගැනීම හා ඒ ඒ ආයතනවල සිදුකරන විශේෂ වැඩසටහන් ඇතුළත් කර පුවරුදෙකක් මසක් ඇතුළත සවි කිරීම සඳහා තීරණය විය.<br>මෙහි දී කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් සාම්පල පුවරුවක්, රැස්වීම සඳහා ඉදිරිපත් කළ අතර එම ආකෘතිය ද අදාල කර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>එසේම, ගොඩනැගිල්ලේ මහල් වල සෝපාන දොරටු අසල අදාල මහලේ මාර්ගෝපදේශ සිතියම් පුවරු ප්‍රදර්ශනය නොවීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් විමසූ අතර, අදාලපුවරු ද මසක් ඇතුළත සවි කිරීම සඳහා ද උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය. |

| | | | |
|---|---|---|---|
| 03. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආපන ශාලාවේ කටයුතු පවත්වාගෙන යාම | ආහාර පාන මිලදී ගැනීමට අදාලව නිකුත් කිරීමට සැලසුම් කර ඇති චක්‍රලේඛයසම්බන්ධව සාකච්ඡා වූ අතර, එහිසංශෝධන සහිත ව ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>කෘෂිකර්ම අමාත්‍යාංශය විසින්පවත්වාගෙන යනු ලබන “WeGreen” වෙළෙඳ කුටියේ ආහාර හා අනෙකුත් ද්‍රව්‍ය වර්ගප්‍රමාණය වැඩිකිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>NLDB වෙළෙඳ කුටිය සති 2ක් ඇතුළත ආරම්භ කිරීම සඳහාකටයුතු සිදු කිරීමට තවදුරටත් උපදෙස් ලබා දෙන ලදී.<br><br>එසේම, ආපන ශාලාවේ ආහාර ගැනීමෙන් අනතුරුව, භාවිත කරන ලද පිඟන් නියමිත රාක්කවලස්ථානගතකිරීම සඳහා තම ආයතනවල නිලධාරීන් දැනුවත් කරන ලෙස දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 04. | ආරක්ෂක විධි විධාන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් බස්නාහිර පළාත් සභාව සඳහාආරක්ෂක උපකරණ මිල දී ගැනීම. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආරක්ෂාව තර කිරීම සඳහා මිල දී ගන්නා ලද පරිලෝකන උපකරණ මේ වන විට සවි කර ඇති බව නි.ප්‍ර.ලේ(ඉංජිනේරු) විසින් ප්‍රකාශ කළ අතර, ආරක්ෂක අංශවල කටයුතු සඳහා ගොඩනැගිල්ලේ අලංකරණයට හානි නොවන පරිදි ආරුක්කු හැඩයෙන් යුත් ආවරණයක් (canapy) සකස්කිරීමටඋපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

<u>**නව යෝජනා**</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම සම්බන්ධව - රා.ප.ච 13/2008(V) | සම්පූර්ණයෙන්විදුලි බලයෙන් ධාවනය වන වාහන භාවිත කරනු ලබන, අනුයුක්ත කළ නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට ද මාසික දීමනාවක් ලබා දීමට හැකි වන පරිදි සිදු කර ඇති සංශෝධන සම්බන්ධව සාකච්ඡා වූ අතර, පළාත් සභාවේ සම්පූර්ණයෙන්විදුලි බලයෙන් ධාවනය වන වාහන භාවිතනොකරන බැවින්,අදාල චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාව සඳහා අදාල කර නොගැනීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ප්‍රමුඛ චක්‍රලේඛ කමිටුව |
| 02. | සතියේ දින වල ප.ව 6.00න් පසු කාර්යාලවල රැඳී සිටීම සම්බන්ධව | ආරක්ෂක හේතුන් මත,සතියේ දින වල ප.ව 6.00න් පසු කාර්යාලවල රැඳී සිටීමෙන් වලකින ලෙසත්, එසේ රැඳී සිටින්නේ නම් එම නිලධාරීන්ගේ විස්තර අමාත්‍යාංශ ලේකම්ගේනිර්දේශය මත ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලෙස තම ආයතනවල නිලධාරීන්දැනුවත් කිරීමට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 03. | 2018පරිපූරකඇස්තමේන්තුව සම්බන්ධව | 2019 වර්ෂයේ මාස 7ක පමණ කාල සීමාවක් ගත වී ඇති බැවින්, සංවර්ධනව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධව සහ2018පරිපූරකඇස්තමේන්තුවහා එහි ප්‍රගතියසම්බන්ධවසාකච්ඡා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීමක් යොදා ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 04. | ජ්‍යෙෂ්ඨ උපදේශිකාවන් විසින් බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමන් වෙත කර්මාන්ත දෙපාර්තමේන්තුව පත්ව ඇති තත්ත්වය පිළිබඳව දැනුම්දුන් ලිපිය සම්බන්ධව | මේ සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ප්‍රගතිය විමසූ අතර, අභ්‍යන්තර විගණන පරීක්ෂණයේ නිර්දේශයන්ට අදාලව කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු සම්බන්ධව සහ මහර ගබඩාව සම්බන්ධ ක්ෂේත්‍ර පරික්ෂාව සම්බන්ධව පසු විපරම් සිදුකර එහි ප්‍රගතිය වාර්තා කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | ලේකම්, මාර්ග ප්‍රවාහන හා කර්මාන්ත අමාත්‍යාංශය |
| 05. | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත්වන ආයතනයන්හි මූල්‍ය සහ කාර්ය සාධනය පිළිබඳ ඇගයීම | 2017 මුදල් වර්ෂය වෙනුවෙන් 2019.07.05 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද සම්මාන උළෙල සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතේ බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන සහ සෞඛ්‍ය යන අමාත්‍යාංශ සහ පළාත් පාලන ආයතන රැසක්රන් සම්මානයෙන් පිදුම් ලද බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දුන් අතර ඒ සඳහා සහාය වූ සියලු දෙනා කෘතඥතා පූර්වකවසිහිපත් කරන ලදී. එසේම, ඔවුන්විශේෂ ඇගයීමකට ලක් කිරීම සඳහා උත්සවයක් සංවිධානය කරන ලෙස දැනුම් දෙන ලදී.<br><br>2018 මුදල් වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය සහ කාර්යසාධනය පිළිබඳ ඇගයීම පිළිබඳව සහඑම ඇගයීම සඳහා සකස්කර ඇති පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය 2019.07.10 දින විවෘත වන අතර, 2019.08.31 දිනෙන් අවසන් වන බවනියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින්දැනුවත් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)<br><br>සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අධිකාරිවල සභාපතිවරු |
| 06. | කාර්යාලයීයප්‍රයෝජනයට ගත ජංගම දුරකථන සහනදායී මිලට ලබා ගැනීම මැයෙන් සභා ලේකම් විසින් ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලද 2/5/3/5 අංක හා 2019 06.24 දිනැති ලිපිය. | බස්නාහිරපළාත් සභාවේ ජංගම දුරකතන ලබා ගැනීමට හිමිකම් ලබන මාණ්ඩලික නිලධාරීන් වෙත පළාත් සභාව විසින් නිකුත් කරනු ලබන ජංගම දුරකථන දිගු කාලයක් භාවිත කිරීමෙන් පසු එම නිලධාරින්ටම සහනදායී මිලකට ලබා ගැනීම සම්බන්ධව 2019.04.25 දින ලේකම්වරුන්ගේ රැස්වීමේ දී සාකච්ඡා කරන ලදුව ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් අනුමැතිය ලබා ගන්නා ලදී.<br>එබැවින්, මෙම අනුමැතිය බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යවරුන්හා ධුරධාරීන් සඳහාද අදාල කර ගැනීම සුදුසු බව සාකච්ඡා වූ අතර, එම ඉල්ලීම ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 07. | ජාතික ආරක්ෂාවට සහය වීම සඳහා "ගම රැකුම" සංවිධානආරම්භ කිරීම සම්බන්ධව | වර්තමානයේරට මුහුණ දෙන අභියෝග ජය ගැනීම සඳහා ජනතාවගේ සහයෝගය ලබා ගත හැකි වැඩසටහන් ලෙසත්, රටේ ජාතික ආරක්ෂාව සඳහාත්, ජනතාවගේ බහුවිධ ආරක්ෂාව සහ සුරක්ෂාව සඳහාත් හේතුවන "ගම රැකුම" සංවිධාන රටේ සෑම නිලධාරි වසමකම ආරම්භ කිරීම සඳහා රජය විසින් ගෙන ඇති තීරණය සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් ලේකම්වරු දැනුවත් කරන ලදී. ඒ අනුව, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත පිළිතුරු යොමු කරන ලෙස නි.ප්‍ර.ලේ (පාලන) වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 08. | ආරක්ෂක සේවා සඳහා මුදල් නොගෙවීම සම්බන්ධව වෙස්ප්‍රෝ ආරක්ෂක සේවයේ අධ්‍යක්ෂ විසින්ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලද WESPRO/AD/83 අංක හා 2019.07.08 දිනැති ලිපිය | කෝට්ටේ මාදිවෙල ඉසුර විද්‍යාලයට දිවා/රාත්‍රී ආරක්ෂක නිලධාරින් දෙදෙනෙකු යෙදවීමහා මේ වන තෙක් ඔවුන් වෙත ආරක්ෂක සේවා සඳහා මුදල් නොගෙවීම සම්බන්ධව සාකච්ඡා වූ අතර, එහි දී ඉදිකිරීමටඅදාල මුල් පිරිවැය ඇස්තමේන්තුවේ පරිපාලන වියදම් මඟින් මෙම වියදම් දැරීමටත්, කොන්ත්‍රාත් කාලය අවසන් වන තුරු පළාත් ආරක්ෂක අංශයේ අවම නිලධාරින් පිරිසක් යොදවා විධිමත් ආරක්ෂක ක්‍රමවේදයක් සැපයීම සඳහාත්, තීරණය විය. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 09. | ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ කාල රාමුව ප්‍රකාශයට පත් කිරීමට සමගාමීව පවත්වන ලද සමුළුව. | 2019.06.26 දිනට යෙදෙන මත්ද්‍රව්‍ය භාවිතය හා නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනය තේමා කර ගනිමින් අතිගරු ජනාධිපතිතුමා විසින් 2019.06.23 – 07.01 දින දක්වා කාලය තුල ජාතිකමත්ද්‍රව්‍ය නිවාරණ සතියක් ප්‍රකාශයට පත් කර කරන ලද අතර, ඊට සමගාමීව පවත්වන ලද බස්නාහිර පළාත් සමාප්ති සමුළුව2019.07.01 දින සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අතිඋත්කර්ෂවත් ලෙසපවත්වන ලදී.<br><br>මෙම ජාතික මහෝත්සවය සංවිධානය කරන ලද බස්නාහිර පළාත් සභාවේ සියලුම නිලධාරින් හට ප්‍රධාන ලේකම්ගේ ස්තූතිය පුද කළ අතර, ඒ සඳහා කැපවූ නිලධාරින් වෙත ප්‍රශංසා සහතික නිකුත් කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 10. | කොරතොට සහ ගබඩාවත්ත ඉඩම් සම්බන්ධව | මේ වන විට කොරතොට සහ ගබඩාවත්ත ඉඩම් සම්බන්ධව ප්‍රගතිය ප්‍රධාන ලේකම් විසින් විමසූ අතර, පළාත්සභා නිලධාරින් සඳහා නිල නිවාස යෝජනා ක්‍රමයට අදාල කමිටු වාර්තාව කඩිනමින් ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | ආණ්ඩුකාර ලේකම් ප්‍රධාන නිල නිවාස කමිටුව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 11. | විවිධ සේවා සමුපකාර සමිතිවල පවතින මූල්‍ය අක්‍රමිකතාව සම්බන්ධව | විවිධ සේවා සමුපකාර සමිතිවල පවතින රු.මිලියන 74ක ඌන ද්‍රවශීලතාව සම්බන්ධව මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කළ අතර,සමුපකාර සංවර්ධන නිලධාරින් සමඟ සාකච්ඡාවක් සූදානම් කිරීම සඳහා ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 12. | පළාත් අමාත්‍ය මණ්ඩලය නොමැති අවස්ථාවල දී අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවක කටයුතු සහ එහි අභියාචනා සම්බන්ධයෙන් වන06/2019 මුල්‍ය චක්‍රලේඛය | 06/2019 මුල්‍ය චක්‍රලේඛය සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් සියලුම ලේකම්වරුන් දැනුවත් කළ අතර, පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරවන ලදී.<br><br>පළාත් අමාත්‍ය මණ්ඩලය නොමැති අවස්ථාවල දී අමාත්‍යමණ්ඩලයක් පත් කරන ප්‍රසම්පාදන කමිටු වල කටයුතු සම්බන්ධයෙන් මුල්‍ය රීති 424 ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාට බලතල හිමිවේ.<br><br>එසේම, අමාත්‍ය මණ්ඩලය නොපවතින අවස්ථාවක රු.මිලියන 250ට වැඩි ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමේ බලය ප්‍රධාන ලේකම්වරයා සතු වන අතර, මෙම ප්‍රසම්පාදන කමිටුවේ තීරණ පිළිබඳ අභියාචනා බලය ගරු ආණ්ඩුකාරතුමාසතුවේ. | සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අධිකාරිවල සභාපතිවරු |
| 13. | පළාත් සංවර්ධන ප්‍රදාන වැඩසටහන - 2019<br>කොළඹ හම්සාමුස්ලිම් විදුහලේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම | කොළඹ හම්සාමුස්ලිම් විදුහලේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ මත සිදුකිරීමට තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

අත්/කළේ: ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ඩබ්ලිව්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).